අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙලකර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාලයේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, කාර්යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම්කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත්කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතුකර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙහි 2024 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව පිළියෙලකර තිබූ නමුත්, ගිණුම්කරණ ප්‍රමිත 7හි 65 ඡේදයට අනුව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩුතරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන්වන දිනයේ දී සමාලෝචනයකර නොතිබුණි.	වත්කම්වල ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ අවශේෂ වටිනාකම වාර්ෂිකව නැවත අගය කිරීම හෝ සමාලෝචනය කිරීම ඒවා පිළිබඳ තාක්ෂණික දැනුම ඇති නිලධාරීන් සහිත කමිටුවක් මගින් ප්‍රමිතියේ සඳහන් ආකාරයට ක්‍රියාත්මක කිරීමට සටහන්කර ගත් බව දන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමේ දී නිවැරදි ප්‍රමිත අනුගමනය කිරීමට කටයුතු කළ යුතු ය.
(ආ)	සමාලෝචිත වර්ෂය තුළ වටිනාකම රු.524,576ක් වූ ස්ථාවර වත්කම් අපහරණය සිදුකර තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7හි)86ඉ)(ii (ඡේදය අනුව එම වත්කම් වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම හා ගිණුම්කරණ ප්‍රමිත 7හි 87(ඇ) අනුව අදාළ වත්කම් අපහරණයෙන් ලද රු.22,400ක මුදල අදාළ අමාත්‍යාංශය වෙත යවා තිබූ නමුත්, මූල්‍ය ප්‍රකාශන වල ඒවා පිළිබඳ ගැලපීම් කිරීම හා අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. ඒ හේතුවෙන් අදාළ වත්කම්	ඉදිරි ගිණුම් වර්ෂවල දී පෙන්වා දී ඇති අඩුපාඩුව මගහරවා ගැනීමට සටහන්කර ගත්බව දන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙලකිරීමේ දී නිවැරදි ප්‍රමිත අනුගමනය කිරීමට කටයුතු කළ යුතු ය.

	ගිණුම්වල හා ඊට අදාළ ක්ෂය වෙන්කිරීමේ ගිණුම්වල ශේෂය නිවැරදි නොවුණි. තවද අපහරණයෙන් ලද ලාභය හෝ අලාභය ගණනයකර අවසන් ගිණුම්වලට ගැළපීමක් සිදුකර නොතිබුණි.		

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කාර්යාලයට අයත් මඩකලපුව ශාඛාවේ 2023 වර්ෂය වෙනුවෙන් බදුකුලිය ලෙස ගෙවිය යුතුව තිබූ රු.900,000ක් වෙනුවට සමාලෝචිත වර්ෂයේ දී රු.1,200,000ක් ගෙවීම හේතුවෙන් වර්ෂයේ බදුකුලිය රු.300,000ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන්වීම නිසා වර්ෂයෙහි අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් සටහන් වී තිබුණි.	උපචිත වියදම් හඳුනාගැනීමේ දී හා ගිණුම්ගත කිරීමේ දී අතපසුවීමක් සිදු වී ඇති අතර, මින් ඉදිරියට එවැනි අතපසුවීම් වලක්වා ගැනීමට කටයුතු කරන ලෙසට නිලධාරීන් දැනුවත් කළ බව දන්වා තිබුණි.	වර්ෂයට අදාළ නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය.
(ආ)	2023 වර්ෂයේ දී විමර්ශන මණ්ඩල ගිණුමෙහි උපචිත වියදම් ලෙස හඳුනානොගත් රු.177,200ක් සමාලෝචිත වර්ෂයේ දී නිරවුල්කර තිබූ අතර, මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විමර්ශන මණ්ඩල ගිණුමෙහි සහ වර්ෂයෙහි අතිරික්තය එම වටිනාකමින් පිළිවෙලින් වැඩියෙන් සහ අඩුවෙන් දක්වා තිබුණි.	උපචිත වියදම් හඳුනාගැනීමේ දී හා ගිණුම්ගත කිරීමේ දී අතපසුවීමක් සිදු වී ඇති අතර, මින් ඉදිරියට එවැනි අතපසුවීම් වලක්වා ගැනීමට කටයුතු කරන ලෙසට නිලධාරීන් දැනුවත් කළ බව දන්වා තිබුණි.	සමාලෝචිත වර්ෂයට අදාළ නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු ය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් රු.9,487,611ක මුදලක් ලබා දී තිබුණ ද, කාර්යාලයෙහි පොත්වලට අනුව එය රු.7,500,000ක් විය. මින් රු.5,659,631ක් වර්ෂය තුළ දී ප්‍රාග්ධනිතකර තිබූ අතර, ඉතිරි වටිනාකම වන රු.3,827,980ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි.	පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් වෙන වෙනම ලබාගෙන එම ප්‍රමාණය වැයකරන ලෙසට නිලධාරීන් දැනුවත් කළ බව දන්වා තිබුණි.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්කළ යුතු ය.

(ඇ)	කාර්යාලයෙහි 2024 වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තුවල ප්‍රාග්ධන වියදම් යටතේ මානව සම්පත් සංවර්ධනය සඳහා රු.1,500,000ක් වෙන්කර තිබුණ ද, කාර්යාලය විසින් පුහුණු වැඩසටහන් සඳහා දරන ලද රු.2,045,833ක වියදම, ප්‍රතිපාදන වෙන්කර තිබූ ප්‍රාග්ධන විෂය යටතේ දැරීම වෙනුවට පුනරාවර්තන වැය විෂය යටතේ වූ විශේෂ විමර්ශන සහ අන්තර්කාලීන වාර්තා වියදම් යටතේ ගිණුම්ගතකර තිබුණි.	මින් ඉදිරියට කාර්යමණ්ඩල පුහුණු කිරීමේ වියදම් ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ ගිණුම්ගත කරන ලෙසට නිලධාරීන් දැනුවත් කළ බව දන්වා තිබුණි.	ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් වෙනම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්කළ යුතු ය.
(ඉ)	නිලධාරීන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් දරනු ලබන වියදම් ප්‍රතිපූරණය කිරීමේ නිසික්‍රමවේදයක් කාර්යාලය තුළ නොමැති අතර, මන්නාරම කාර්යාලයෙහි සේවයේ නියුතු නිලධාරිනියකගේ පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා දරන ලද රු.121,500ක් වූ මුදල ආයතනයේ නිතීමය කටයුතු සම්බන්ධයෙන් දරනු ලබන වියදමක් සේ සලකා නිති වියදම්වලට එකතුකිරීම නිසා සමාලෝචිත වර්ෂයෙහි අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	මින් ඉදිරියට ප්‍රතිපාදන සලසා නොමැති නම් වියදම් ගිණුම්ගත නොකරන ලෙසට නිලධාරීන් දැනුවත් කළ අතර, අදාළ නිලධාරිනියට පශ්චාත් උපාධියට ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනුමැතිය ලැබී ඇති බව දන්වා තිබුණි.	නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම සහ අවශ්‍යතාවයන් ඇති නිලධාරීන්ට පමණක් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු ය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 අත්තිකාරම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9.1(ආ) පරිච්ඡේදය සහ මුදල් රෙගුලාසි 371(5) අනුව අතුරු අග්‍රිමයක් නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන්කර දින 10ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවිය යුතු වුව ද, කාර්යාලයේ නිලධාරීන් 29දෙනෙකු විසින් අවස්ථා 68ක දී ලබාගත් අතුරු අග්‍රිම	යාපනය, මන්නාරම, මඩකලපුව වැනි දුර ප්‍රදේශවල විවිධ වැඩසටහන් සඳහා සම්බන්ධීකාරකවරයන් වෙත නිකුත්කරනු ලබන අතුරු අග්‍රිම පියවීමට අදාළ වවුචර්පත් තැපෑලෙන් ලැබීමේ දී යම් ප්‍රමාදයක් සිදුවන අතර, අග්‍රිම පියවීමේ දී සිදුවන අනවශ්‍ය ප්‍රමාදයන් වළක්වා ගැනීමට ඉදිරියේ දී අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකළ යුතු ය.

	පියවීමට දින 11 සිට 96 දක්වා කාලපරාසයක් ප්‍රමාදකර තිබුණි.		
(ආ)	ඉහත (අ)හි චක්‍රලේඛයේ 9.1(ඇ) සහ මුදල් රෙගුලාසි 371(4) අනුව නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබානොගත යුතු යැයි සඳහන් වුව ද, කාර්යාලයේ නිලධාරීන් හයදෙනෙකු විසින් විමර්ශන වැඩසටහන් සඳහා අවස්ථා 07ක දී ලබාගත් රු.574,000ක මුදල වැයකිරීමකින් තොරව ආපසු පියවීමට දින 06 සිට දින 27 කාලයක් ලබාගෙන තිබුණි.	ප්‍රමාදයක් සිදු වී ඇති බව පිළිගන්නා අතර, අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි විමර්ශනය කිරීම වෙනුවෙන් වැය වන වියදම් වෙනුවෙන් නිකුත්කරනු ලබන අත්තිකාරම් සමහර අවස්ථාවල දී ඇස්තමේන්තුගත ප්‍රමාණයටම වියදම් නොවන අවස්ථා ඇති බවත්, ඒවා කාර්යාලයේ පාලනයෙන් බැහැරව සිදුවන බවත්, ඉදිරියේ දී අවශ්‍යතා හඳුනාගෙන අවශ්‍යතාවයට සරිලන පරිදි ඇස්තමේන්තු පිළියෙළකර එම ප්‍රමාණයට අත්තිකාරම් ලබාගන්නා ලෙසට නිලධාරීන් දැනුවත්කළ බවත් දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකළ යුතු ය.

1.7 නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 395(ඌ)	බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙලකළ යුත්තේ බැංකුවේ මුදල් තැන්පත් කිරීම, චෙක්පත් ලිවීම හෝ මුදල් පොත පවත්වා ගැනීම පිළිබඳ කිසිම සම්බන්ධයක් නොමැති නිලධාරියෙකු විසින් බව දන්වා තිබුණ ද, ඊට පටහැනිව මුදල් පොත සම්බන්ධව කටයුතු කරන නිලධාරියා විසින්ම බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙලකර තිබුණි.	විගණන නිරීක්ෂණය සමග එකගවන අතර, නිලධාරීන්ගේ හිඟය නිසා එය ක්‍රියාත්මක කළ නොහැකි බවත්, නිලධාරීන් බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලා ඇති අතර, නිලධාරීන් බඳවා ගැනීමෙන් පසු බැංකු සැසඳුම් පිළියෙල කිරීම වෙනත් නිලධාරියෙකු වෙත පැවරීමට සටහන්කර ගත් බවත් දන්වා තිබුණි.	යොමුගත රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන මුදල් අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වන ආයතනික	අත්පොතෙහි සඳහන් ආකාරයට වාර්ෂික අයවැය පිළියෙලකර නොතිබුණි.	අමාත්‍යාංශයෙන් ලැබෙන අක්මුදල් මත පමණක් ආයතනය යැපෙන හෙයින්, එහි සඳහන් සමහර මාර්ගෝපදේශයන් අනුව කටයුතුකිරීම	යොමුගත මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

	පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඇමුණුම 1හි 3 ඡේදය		අසීරු වන අතර, කෙසේ වෙතත් එහි සඳහන් මාර්ගෝපදේශයන් අනුව උපරිමයෙන් කටයුතු කිරීමට සටහන්කර ගත් බව දන්වා තිබුණි.	
(ඇ)	2024 අප්‍රේල් 30 දිනැති අංක 02/2024 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 1.2.7 ඡේදය	කාර්යාලය සතු කාර් රථ දෙකක් චක්‍රලේඛයට පටහැනිව රු.8,000,000කට තක්සේරුකර තිබුණි.	මෙම තක්සේරුව අග්‍රහාර රක්ෂණ භාර අරමුදලෙන් ලබාදුන් රක්ෂණ වටිනාකම බවත්, විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි තක්සේරුකර පොත්වල අවශ්‍ය ගැළපීම් කිරීමට සටහන්කර ගත් බවත් දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

1.8 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
බැංකු සැසඳුම් ප්‍රකාශයෙහි 2024 වර්ෂයෙහි මාර්තු මාසයේ සිට හඳුනානොගත් ගෙවීම් ලෙස රු.148,900ක් දක්වා තිබූ අතර, එම ගෙවීම් සමාලෝචිත වර්ෂයේ දී නැවත අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.	බැංකු සැසඳුමේ සඳහන් ගෙවීම් පිළිබඳව නිලධාරීන් දැනුවත්කර, එම මුදල් ඉක්මනින් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට සටහන්කර ගත් බව දන්වා තිබුණි.	ගෙවීම් හඳුනාගෙන නැවත කඩිනමින් අයකර ගැනීමට කටයුතුකළ යුතු ය.

1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද චක්‍රලේඛයේ 07 ඡේදයෙහි බදුචක්‍ර අංක 01 අනුව සමාලෝචිත වර්ෂය තුළ දී සේවා නියුක්තිය මගින් ලැබෙන නිත්‍ය ලාභවලින් නිලධාරීන් 04දෙනෙකුගේ වැටුපෙන් බදු වගකීමට වඩා රු.99,788ක් අඩුවෙන් බදු ගණනයකර තිබූ අතර, බදු අයකරනු ලබන නිලධාරීන්ගේ බදු සඳහා ආදායම	මෙවැනි ප්‍රමාදයන් වළක්වා නිවැරදිව බදු ගණනය කිරීමට නිලධාරීන් දැනුවත්කළ බවත්, මේ වන විට නිවැරදිව කටයුතු කරන බවත් දන්වා තිබුණි.	බදු චක්‍රලේඛවලට අනුකූලව නිවැරදි බදු වටිනාකම් ගණනය කිරීමට කටයුතුකළ යුතු ය.

	ගණනය කිරීමේ දී නිලධාරීන් 04කට සමාලෝචිත වර්ෂයෙහි සැප්තැම්බර්, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාසවල දී විමර්ශනවලට සහභාගිවීම වෙනුවෙන් ගෙවන ලද රු.628,475ක විමර්ශන මණ්ඩල දීමනා බදු අයකළ හැකි ආදායමට එකතුකර නොතිබුණි.		
(ආ)	බදුචක්‍ර අංක 05 ප්‍රකාරව රැකියාවෙන් සමුච්චිත ලාභ මත බදු අඩුකිරීමේ දී කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 5දෙනෙකුගෙන් බදු වැඩියෙන් ද නිලධාරීන් තිදෙනෙකුගෙන් බදු අඩුවෙන් ද ගණනයකර තිබුණි.	මෙවැනි අතපසුවීම් නැවත සිදු නොවීමට වගබලා ගන්නා ලෙස නිලධාරීන් දැනුවත්කළ බව දන්වා තිබුණි.	බදු චක්‍රලේඛවලට අනුකූලව නිවැරදි බදු වටිනාකම් ගණනය කිරීමට කටයුතුකළ යුතු ය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,851,889ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 11,545,375ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.15,397,264ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන ලැබීම් රු.38,887,541කින් වැඩිවීමට සාපේක්ෂව පුද්ගල වියදම් රු.14,715,121කින් වැඩිවීම, සැපයීම් රු.2,695,669කින් වැඩිවීම හා ගමන් වියදම් රු.2,430,478කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) පසුගිය වර්ෂයෙහි ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම සඳහා රු.9,057,144ක් ද, සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා රු.5,659,631ක් ද, වැයකර තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන කළ සත්‍ය වියදමෙහි රු.3,397,513ක් එනම් වියදමෙහි සියයට 38ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) පසුගිය වර්ෂයෙහි පුද්ගලික පාරිශ්‍රමික සඳහා රු.31,012,002ක් ද, සමාලෝචිත වර්ෂයෙහි ඒ සඳහා රු.45,727,123ක් ද, දරා තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන කළ රු.14,715,121ක එනම් සියයට 47 වියදමෙහි වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඇ) සැපයුම් වියදම් සඳහා පසුගිය වර්ෂයෙහි රු.3,699,098ක් සහ සමාලෝචිත වර්ෂයෙහි ඒ සඳහා රු.6,394,765ක් දරා තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂයට වඩා වියදමෙහි රු.2,695,667ක් එනම් සියයට 73ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඈ) අලුත්වැඩියා වියදම් සඳහා පසුගිය වර්ෂයෙහි රු.1,476,286ක් ද, සමාලෝචිත වර්ෂයේ දී ඒ සඳහා රු.6,270,911ක් ද, වැයකර තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂයට වඩා වියදමෙහි රු.4,794,625ක එනම් සියයට 325ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාලය විසින් විමර්ශනය අවසන්කළ ලිපිගොනු 2,109ක් පුනර්ජීවන දීමනා ගෙවීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත යවන ලද නමුත්, එම කාර්යාලය විසින් දෙසැම්බර් 31 දිනට ලිපිගොනු 1,930කට පුනර්ජීවන දීමනා ගෙවා තිබූ අතර, ලිපිගොනු 127ක් නැවත වරක් දීමනා ගෙවීම සඳහා වර්ෂය තුළ දී ඉදිරිපත්කර තිබුණි.	අතුරුදහන් වූ තැනැත්තෙකු සම්බන්ධයෙන් අයදුම්කරුවන් කිහිපදෙනෙකු එනම් මව, බිරිඳ, සහෝදර සහෝදරියන් ඉදිරිපත්වන අවස්ථා ඇති විටක දී එකම පුද්ගලයෙකු නමින් ලිපිගොනු කිහිපයක් විවෘතවන අවස්ථා ඇති අතර, එම හේතුව නිසා මෙවැනි ලිපිගොනු දෙවරක් ඉදිරිපත් විය හැකි බවත්, කෙසේ වෙතත් මින් ඉදිරියට මේ පිළිබඳව පරීක්ෂාකාරී වන ලෙසට නිලධාරීන් දැනුවත් කළ බවත් දන්වා ඇත.	ගෙවීම් සඳහා යැවීමට පෙර, නිවැරදිතාවය පරීක්ෂා කර බැලීමට කටයුතු කළ යුතු ය.
(ආ)	විමර්ශන කටයුතු අවසන්කර ඒ සම්බන්ධයෙන් කළමනාකරණ වාර්තාව ලබාගැනීමෙන් පසු රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත මරණ සහතික නිකුත්කිරීමට ලිපිගොනු 318ක් සහ දක්නට නොමැති සහතික නිකුත්කිරීමට ලිපිගොනු 1,964ක් යොමුකර තිබුණි. වර්ෂය තුළ දී මරණ සහතික 56ක් සහ දක්නට නොමැති සහතික 279ක් ඉදිරිපත්කර තිබූ අතර, පිළිවෙලින් එය සියයට 18ක සහ සියයට 14ක වැනි අඩුමට්ටමක පැවතුණි.	මේ පිළිබඳව 2023 මාර්තු 26 දින ද ඇතුළුව අවස්ථා 6ක දී ප්‍රගතිය ඉල්ලා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ලිපි යවා තිබූ බවත්, 2025 ජුනි 02 දින ඒ සඳහා පිළිතුරු ලැබී තිබූ බවත්, මේ සම්බන්ධයෙන් අඛණ්ඩව රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව සමග කටයුතු කරන බවත් දන්වා තිබුණි.	පසුවිපරම් කටයුතු අඛණ්ඩව සිදුකිරීමට කටයුතු කළ යුතු ය.
(ඇ)	කාර්යාලය විසින් මූලික විමර්ශන කටයුතු අවසන්වීමෙන් පසු වැඩිදුර විමර්ශනය සඳහා සෙවීම් හා විමර්ශන අංශය වෙත ලිපිගොනු 526ක් වර්ෂය තුළ දී යොමුකර තිබුණ ද, අදාළ අංශය විසින් වර්ෂය තුළ දී ලිපිගොනු 17ක විමර්ශන කටයුතු නිමකර තිබුණි.	එම ලිපිගොනු 526 අතුරින් ලිපිගොනු 17ක ක්‍රියාමාර්ග අවසන් වී පුද්ගල ඉරණම තහවුරු කරගෙන ඇති බවට ද, එයින් අතුරුදහන් වූ පුද්ගලයන් 15ක් ජීවත්ව සිටින බවට ද, දෙදෙනෙකු මියගොස් ඇති බවට ද කරුණු අනාවරණය වී ඇති අතර, අනෙකුත් ලිපිගොනු සඳහා තවදුරටත් වැඩිදුර විමර්ශන සිදු කෙරෙමින් පවතින බව දන්වා තිබුණි.	කඩිනමින් විමර්ශන කටයුතු අවසන්කර ගැනීමට කටයුතුකළ යුතු ය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමට අදාළ පනතෙහි 11 කොටසෙහි කාර්යාලයෙහි බලතල, කාර්යය සහ කාර්යභාරය දක්වා ඇති අතර, එහි 10(1)(අ) වගන්තිය අනුව අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ සොයා ගැනීමට සහ ඒ සඳහා උචිත යාන්ත්‍රණ හඳුනාගැනීම කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂයේ දෙවන අදියර යටතේ විමර්ශනය සඳහා ඇති ලිපිගොනු 8,963න්, සමාලෝචිත වර්ෂය තුළ විමර්ශනය සඳහා ලිපිගොනු 1104ක් පිළියෙලකර තිබුණ ද, විමර්ශනයකර නොතිබුණි.	ලිපිගොනු 1,104කට අදාළව විමර්ශන පැවැත්වීමට සූදානම්කර තිබුණු නමුත්, විමර්ශන පැවැත්වීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලැබීම නිසා තෙවන සහ සිව්වන කාර්තුවල දී දෙවන අදියරට අදාළ ලිපිගොනු සැකසීම වෙනුවට, පළමු අදියරට අදාළව නව පැමිණිලි සහ මීට පෙර විමර්ශන සඳහා කැඳවීම් කරන ලද නමුත්, ඒ සඳහා නොපැමිණි අයදුම්කරුවන්ගේ ලිපිගොනු පරීක්ෂාකර ඔවුන් නැවත කැඳවා විමර්ශන සිදුකිරීම් 1,227ක් 2024 වර්ෂය තුළ අවසන්කළ බව දන්වා තිබුණි.	ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකළ යුතු ය.

3.3 නිෂ්කාර්යය හෝ ඌණ උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දී කාර්යාලය සතු මෝටර් රථ දෙක රු.8,000,000කට තක්සේරුකර තිබූ අතර, වර්ෂය තුළ මෙම මෝටර් රථ දෙක අලුත්වැඩියා කටයුතු සඳහා රු.1,078,106ක් වැයකර තිබුණ ද, වර්ෂය තුළ ධාවනයකර නොතිබුණි.	2024 වර්ෂය තුළ රියදුරන් බඳවා ගැනීමට අපේක්ෂා කළ ද එය සම්පූර්ණකර ගැනීමට නොහැකි වූ හෙයින්, රියදුරන් නොමැතිකම නිසා මෝටර් රථ ධාවනය කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි.	පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමට කටයුතු කළ යුතු ය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ කාර්යාලයේ ඇලුමිනියම් පා(ර්)ටිෂන් සවිකිරීම සඳහා රු.1,379,575ක් වැයකර තිබූ අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2(අ) ඡේදය අනුව ඉදිරිපත් වූ සැපයුම්කරුගේ මිල වෙළඳපොළ මිලගණන් අනුව සසඳා නොතිබූ අතර,	තාක්ෂණික නිලධාරීන් විසින් ඇස්තමේන්තුව පවතින රේටයන් පදනම් කරගෙන පිළියෙලකර ඇති බැවින්, එම ඇස්තමේන්තු මුදලට වඩා අඩු මුදලකට එම කාර්යය පවරා ඇතිබව දන්වා තිබූ අතර, මින් ඉදිරියට එවැනි අතපසුවීමක් සිදුනොවීමට වගබලා ගන්නා ලෙසට නිලධාරීන් දැනුවත්කළ	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතු ය.

	තෝරාගෙන තිබූ එම සැපයුම්කරු සමග මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ඡේදය අනුව ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද මෙම සේවාව නිම කිරීමෙන් පසුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ඡේදය අනුව එහි ඇතුලත්ව තිබූ පිරිවිතරවලට අනුව එම කාර්යය ඉටුකළ බවට තහවුරු කිරීමකින් තොරව මුදල් ගෙවා තිබුණි. මීට අමතරව ප්‍රසම්පාදන කාර්යසංග්‍රහයෙහි අතිරේක 40 සහ එහි 2.14.1 ඡේදය අනුව මෙම කොන්ත්‍රාත්තුව සහ රු.308,423ක් වැයකර ලේඛනාගාරයේ කාපට් ඇතිරීම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ආයතන ප්‍රධානියාගේ අනුමැතියකින් තොරව මූල්‍ය හා ප්‍රසම්පාදන අංශ ප්‍රධානීගේ අත්සනින් යුතුව අදාළ ආයතන වෙත කාර්යයන් පවරා තිබුණි.	බවත්, ඇස්තමේන්තුවට අනුව මෙම කාර්යය ඉටුකරන ලද බවට මානව සම්පත් කළමනාකරු විසින් සහතික කර තිබූ අතර, අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු මුදලින් සියයට 57ක මුදලක් රඳවා ගැනීමට කටයුතුකර ඇති බවත්, මේ දක්වා එම කාර්යය සම්බන්ධයෙන් කිසිදු දෝෂයක් වාර්තා වී නැති බවත් දන්වා තිබුණි.	
(ආ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.6.1 (ඇ) ඡේදය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිවරයා හෝ එම කමිටුවේ සාමාජිකයන් අතරින් තෝරාගනු ලබන සභාපතිවරයාගේ නාමිකයෙකු ලංසු තැබීමට පූර්වයෙන් වූ රැස්වීමට සහභාගි විය යුතු වුව ද, රු.1,549,857ක් වැයකර කාර්යාලයේ අංශ 05ක් සඳහා වායුසමීකරණ යන්ත්‍ර 05ක් මිලදීගැනීමට අදාළ ප්‍රසම්පාදනයේදී එසේ සිදුකර නොතිබුණි. එමෙන්ම 2.12 (අ) ඡේදය ප්‍රකාරව, ප්‍රසම්පාදන කමිටුවල සහ තාක්ෂණික ඇගයීම් කමිටුවල සියළු සාමාජිකයින් ප්‍රසම්පාදන කාර්යසංග්‍රහයේ ආකෘතිපත්‍රය ප්‍රකාරව ප්‍රකාශයක් අත්සන් කළ යුතු වුව ද, කමිටුවේ සාමාජිකයින් විසින් එම ප්‍රකාශය අත්සන්කර	ලංසු කැඳවීම සඳහා භාවිතාකරන ලද ලේඛනවල ලංසු තැබීමට පූර්වයෙන් රැස්වීම (Prebid meeting) තබන බවට කිසිදු සඳහනක්කර නොමැති අතර, එවැනි Prebid meeting සංකීර්ණ ප්‍රසම්පාදන කටයුතුවල දී සිදුකළ ද, මෙම කටයුත්තේ දී එවැනි සංකීර්ණ පැහැදිලි කිරීමක් නොතිබූ බැවින් (Prebid meeting) තැබීමට කටයුතු කර නොමැති බව දන්වා තිබූ අතර, මින් ඉදිරියට එවැනි අතපසුවීමක් සිදුනොවීමට වගබලා ගන්නා ලෙසට නිලධාරීන් දැනුවත්කළ බව දන්වා තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතු ය.

	නොතිබුණු අතර, 8.9.1(ආ) ඡේදය ප්‍රකාරව ගිවිසුමකටද එළැඹ නොතිබුණි.		
(ඇ)	සමාලෝචිත වර්ෂයේ දී කාර්යාලයෙහි නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් දෙකක් රු.2,049,242ක් වැයකර පවත්වා තිබුණ ද, අවශ්‍ය ස්ථාන තෝරා ගැනීම සහ අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා කටයුතු කිරීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි කිසිදු අවශ්‍යතාවයක් සම්පූර්ණකර නොතිබුණි.	එක් වැඩසටහනක් සඳහා පමණක් මිලගණන් කැඳවා ජාතික ජල සම්පාදන හා ජලාවාහන මණ්ඩලයට අයත් **CEWAS** ආයතනයේ දී ද, අනෙක් වැඩසටහන බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ද පවත්වා ඇති අතර, ඉහත කී ආයතන දෙකම රජයට අයත් ආයතන දෙකක් බව දන්වා තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතු ය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාලයෙහි අනුමත කාර්යමණ්ඩලය 255ක් වුව ද, සත්‍ය කාර්යමණ්ඩලය 37ක් විය. කාර්යාලයේ කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට උපකාරීවන තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 8කගේ සහ තෘතියික මට්ටමේ නිලධාරීන් 25කගේ තනතුරු පුරප්පාඩු හේතුවෙන් කාර්යාලයේ කටයුතු කරගෙන යාමේ දී එය බාධාවක් වී තිබුණි.	නිලධාරීන් බඳවාගැනීමට අපේක්ෂා කළ ද, ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ හෙයින් එය සම්පූර්ණකර ගැනීමට නොහැකි වූ අතර, 2025 වර්ෂය තුළ දී නවක නිලධාරීන් බඳවාගැනීමට අනුමැතිය ලද විගස බඳවාගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	කඩිනමින් පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු ය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන මුදල් අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වන අත්පොතෙහි 6.6 ඡේදය අනුව ගිණුම් වර්ෂය අවසාන වී දින 60ක් තුළ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණනය වෙත	අවසන් ගිණුම් පිළියෙළකර 2025 මාර්තු 14 දින විගණනය වෙත ඉදිරිපත්කර තිබූ නමුත්, එහි මූලික දෝෂයන් හේතුවෙන් 2025 මැයි 27 දින නැවත ඉදිරිපත්කළ අතර, ගිණුම් අංශයේ රාජකාරී බෙදා ඒවා විධිමත්ව පැවරීමට තරම් ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොසිටීම නිසා	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

	ඉදිරිපත්කළ යුතු වුව ද, කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන 2025 මැයි 27 දින ඉදිරිපත් කළ අතර, වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ඒ සමග ඉදිරිපත්කර නොතිබුණි.	මෙම දෝෂයන් හා ප්‍රමාදයන් සිදු වී ඇති බව දන්වා තිබුණි.	

4.2 **වාර්ෂික වාර්තාව**

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන මුදල් අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද රාජ්‍ය ව්‍යාපාර සඳහා වන අත්පොතෙහි 6.6 ඡේදය අනුව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන හා මතය ඇතුළත් කාර්යාලයෙහි වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී මාස 5ක් තුළ පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2023 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2025 මාර්තු මස 07වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර තිබුණි.	ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොසිටීම නිසා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ අතර, 2024 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.

4.3 **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දී රු.8,800,000ක් වැයකර ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ වැඩසටහන් 10ක් වර්ෂය තුළ දී ක්‍රියාත්මකකර නොතිබූ අතර, වැඩසටහන් 4ක් සඳහා ඇස්තමේන්තු කළ මුදලට වඩා සියයට 122 සිට සියයට 459 අතර පරාසයක වියදමෙහි වැඩිවීමක් ද, වැඩසටහන් 08ක සියයට 82කට වඩා මුදල් ඉතිරි වීමක් ද තිබුණි.	Data Base Management System එකක් සැලසුම්කළ නමුත් ICRC ආයතනය එම පද්ධතිය නොමිලේ ලබාදීමට එකඟතාවය පළකර තිබීමත්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සඳහා මුදල් වෙන්කර තිබුණ ද, එම නිලධාරීන් මුල් අවස්ථාවේ පැවැත් වූ විභාගයෙන් අසමත් වී ඇති හෙයින් ඒ සඳහා රජයේ මුදල් වැයකළ නොහැකිවීමත්, 2023 වර්ෂයේ පිළියෙල කර තිබූ ඇස්තමේන්තුවෙහි සඳහන් කාර්යයන් 2024 සිව්වන කාර්තුවේදී ක්‍රියාත්මක කිරීමට යාමේදී භාණ්ඩවල මිල ගණන් ඉහල ගොස් තිබීමත්, විදේශ නියෝජිත ආයතන විසින් යම්යම් කාර්යයන් සඳහා සම්පත්	ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකළ යුතු ය.

		දායකත්වය ලබාදීමත් මේ සඳහා හේතුවූ බව දන්වා තිබුණි.	
(ආ)	වින්දිත සහ පවුල් සහය ඒකකය විසින් වින්දිත පවුල්වල සාමාජිකයන්ගේ මානසික සෞඛ්‍යය හා මනෝ සාමාජීය සහය ලබාදීම සඳහා වැඩසටහන් පැවැත්වීමට රුපියල් මිලියන 3.4ක් වෙන්කර තිබුණ ද, එහි මූල්‍ය ප්‍රගතිය සඳහන්කර නොතිබුණි. එමෙන්ම මේ යටතේ රුපියල් මිලියන 1.4ක් වැයකර දිස්ත්‍රික්ක 6ක වැඩසටහන් 6ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණ ද, එක වැඩසටහනක් පමණක් පවත්වා තිබූ අතර, ඇස්තමේන්තුකළ වැඩසටහන් හා සසඳන කළ එහි ප්‍රගතිය සියයට 16ක වැනි අඩුමට්ටමක පැවතුණි.	වින්දිත සහ වින්දිත පවුල් සහයක ඒකකයේ එක් නිලධාරියෙක් පමණක් සිටීම නිසාත් මානසික සෞඛ්‍යය සහ මනෝ සාමාජීය සහාය පිළිබඳ දැනුම ඇති දමිළ භාෂාව කතා කළ හැකි නිලධාරීන් නොමැතිවීම නිසාත්, මෙම වැඩසටහන් පැවැත්වීමට නොහැකි වූ බව දන්වා තිබුණි.	ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකළ යුතු ය.
(ඇ)	ආරක්ෂණ ඒකකය විසින් වර්ෂය තුළ රුපියල් මිලියන 1.2ක් වැයකර වින්දිත පවුල් සඳහා උපදේශන කටයුතු සඳහා සහාය දැක්වීමට වැඩසටහන් 12ක් පමණ පැවැත්වීමට ඇස්තමේන්තුකර තිබුණ ද, වර්ෂය තුළ දී වැඩසටහන් 01ක් පමණක් පවත්වා තිබුණු අතර, ඇස්තමේන්තු කළ වැඩසටහන් හා සසඳන කළ මෙය සියයට 08ක් වැනි අඩුමට්ටමක පැවතුණි.	වින්දිත පවුල් සඳහා මානසික සෞඛ්‍යය හා මනෝ සමාජීය සහය ලබාදීමට වැඩසටහන් පැවැත්වීමට සැලසුම්කළ ද, අවශ්‍ය නිලධාරීන් නොසිටිය හෙයින් එම වැඩසටහන් 12න් එකක් පමණක් පැවැත් වූ බව දන්වා තිබුණි.	ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකළ යුතු ය.
(ඈ)	නීති අංශයෙහි නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීමට සමාලෝචිත වර්ෂයේ දී රු.700,000ක් ඇස්තමේන්තුකර තිබුණ ද, රු.1,000ක් වැයකර වර්ෂය තුළ දී වැඩසටහන් 2ක් පමණක් පවත්වා තිබුණි. මෙම වැඩසටහනෙහි භෞතික ප්‍රගතිය සියයට 40ක මට්ටමේ පැවති අතර, ඇස්තමේන්තුකළ මුදලින් සියයට 99ක් ඉතිරි වී තිබුණි.	2024 වර්ෂයේ නීති අංශයේ නිලධාරීන් තුන්දෙනෙකු පමණක් රාජකාරී කටයුතුවල යෙදී සිටි හෙයින් කාර්යාලය තුළම එකී ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලද බවත්, ඒ නිසා ශාලා පහසුකම්, ප්‍රවාහන වියදම් හෝ අමතර ආහාර සඳහා වියදමක් සිදු නොවූ බවත් දන්වා තිබුණි.	නීති අංශයේ නිලධාරීන්ගේ ධාරිතාවය වැඩිකර ගැනීම සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

(ඉ)	නීති අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ පවුල් 100ක සාමාජිකයන්ගේ සමාජ සුභසාධන ගැටලුවලට සහාය දැක්වීම සඳහා ජංගම සේවා වැඩසටහන් පැවැත්වීමට රු.500,000ක් වෙන්කර තිබුණ ද, වර්ෂය තුළ දී රු.136,000ක් වැයකර හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් පමණක් පවත්වා තිබුණි. මෙම වැඩසටහනෙහි භෞතික ප්‍රගතිය සියයට 45ක් ලෙස දැක්වුව ද, මුදල් වෙන්කරන ලද අරමුණ එනම් පවුල් 100කගේ සමාජ සුභසාධන ගැටලුවලට සහාය දක්වා නොතිබුණි.	2024 වර්ෂයේ තුන්වන කාර්තුව වන විට නීති අංශයේ නිලධාරීන් තුන්දෙනෙකු පමණක් රාජකාරීවල යෙදී සිටීම නිසා ජංගම සේවා වැඩ සටහන් සංවිධානය කිරීමට සහ පැවැත්වීමට ප්‍රමාණවත් තරම් ශක්‍යතාවක් නොතිබුණු බවත්, හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල නියෝජනය වන පරිදි රාජ්‍ය නිලධාරීන් හැටදෙනෙකු සහභාගීකර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ බවත් දන්වා තිබුණි.	නීති අංශයේ නිලධාරීන්ගේ ධාරිතාවය වැඩිකිරීමට සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.
(ඊ)	ගවේෂණ අත්පොත් සහ විමර්ශන උපායමාර්ග පිළියෙල කිරීම සඳහා වර්ෂය තුළදී රු2.,321,983ක් වැයකර තිබූ නමුත්, ඒ සඳහා කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී වෙන්කර නොතිබූ අතර, ගවේෂණ සහ විමර්ශනයන්ට අදාළ වාර්තා, ප්‍රකාශන සහ අත්පොත් ආදිය මුද්‍රණය කිරීම සඳහා රු1.,500,000ක් වෙන්කර තිබුණද, එම කාර්යයන් නිම කිරීමට කටයුතු කර නොතිබුණි.	ගවේෂණ අත්පොත් සහ විමර්ශන උපායමාර්ග පිළියෙල කිරීම සඳහා අදාළ මූලික කාර්යයන් ආරම්භ කර කටයුතු කරමින් තිබුණ ද, 2024 වර්ෂය අවසාන වන විටත් එය අවසාන වී නොතිබුණු හෙයින් ප්‍රතිපාදන ඉතිරියක් පෙන්වන අතර, ගවේෂණ අත්පොත් සහ විමර්ශන උපායමාර්ග පිළියෙල කිරීම සඳහා කළ වියදම විශේෂ විමර්ශන වාර්තා යටතේ දරා ඇති බව දන්වා තිබුණි.	ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකළ යුතු ය.